**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ**
**දෙපාර්තමේන්තුගත නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය**

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තියේ විධිවිධානවලට අනුව මෙම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු මෙම පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් හා ක්‍රමවේදය පිළිබඳ විස්තර

### 2.1 අදාළ නිලධරයන්

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධරයන් (විධායක නොවන) සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අදාළ වේ.

i. රෙජිස්ට්‍රාර් සේවය II පන්තිය (ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් )
ii. රෙජිස්ට්‍රාර් සේවය III පන්තිය (II/I ශ්‍රේණි)
iii. ලේඛන සහකාර සේවය (III/II/I ශ්‍රේණි)
iv. පොත් බැඳුම්කරු සේවය (III/II/I ශ්‍රේණි)

### 2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය

2.2.1 එකම සේවා ස්ථානයක අඛණ්ඩව වසර 03 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2.2.2.1 රෙජිස්ට්‍රාර් සේවයේ III-I සහ III-II ශ්‍රේණි සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවා කාලය වසර 05 යනු එකම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම හෝ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කිපයක වසර 05 ක් අඛණ්ඩව සේවය කිරීම ලෙස සලකනු ලැබේ.

### 2.3 ක්‍රමවේද සහ අනෙකුත් කරුණු

i. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදයේ යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් සළකා බැලිය හැකිය.

ii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇතිවිට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

iii. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේ දී සේවා අවශ්‍යතාවයන් ද කාර්යාලවල කාර්ය මණ්ඩල සමබරතාවය රැකීමට ද හැම විටම උත්සහ කළ යුතු වේ.



CamScanner

iv. වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරු වීම් ලබා දීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරීන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

### 2.3.1 සේවා කාලය ගණනය කිරීම

i. වාර්ෂික ස්ථානමාරුවීම්වල දී සේවා කාලය ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා :- 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2025.12.31 දිනය)

ii. සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කල දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරනු ලැබේ. (තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

### 3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

I. නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
II. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු දරණ නිලධාරීන් දෙදෙනෙක්
III. දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු භාර පරිපාලන නිලධාරිවරයෙක්
IV. වාර්ෂික ස්ථානමාරු කමිටුවේ විෂය පථයට අයත්වන නිලධර කණ්ඩායම හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම ලියාපදිංචි වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙකු බැගින් සමන්විත ස්ථාන මාරු කමිටුව මගින් මාරු වීම් සිදු කල යුතු වේ.

### 4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

I. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
II. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙක් (සිවිල්/නොතාරිස්)
III. නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් යන නිලධාරීන්ගෙන් දෙදෙනෙක්

### 5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

### 5.1 විශේෂිත කරුණු

i. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයකට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතුය.

ii. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

### 5.2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන්

i. වයස අවු 53 ට වැඩි නිලධාරීන්ගේ කැමැත්ත පරිදි දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කළ හැකි අතර, දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කළ හැකිය.



CamScanner

ii. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා 2026 වර්ෂය සඳහා 2025.12.31 දිනට) අවු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකළ යුතුය.

5.3 **වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 272 සිට 277 දක්වා වගන්ති අදාල වේ.

6. **වාර්ෂික ස්ථාන මාරු කාල සටහන**

2027 වාර්ෂික ස්ථාන මාරු කාල සටහන (සංශෝධිත)

| | |
|---|---|
| ජූලි 31 ට පෙර | වාර්ෂික ස්ථානමාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| අගෝස්තු 21 ට පෙර | ආයතන/කාර්යාලයීය ප්‍රධානියා විසින් නිර්දේශ කරන අයදුම්පත් යොමු කිරීම |
| සැප්තැම්බර් 22 ට පෙර | ස්ථාන මාරු කමිටු රැස් වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම |
| ඔක්තෝම්බර් 07 ට පෙර | ස්ථාන මාරු තීරණ දැන්වීම |
| ඔක්තෝම්බර් 21 ට පෙර | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය |
| නොවැම්බර් 17 ට පෙර | එම අභියාචනා පිළිබඳ සමාලෝචන කමිටු මඟින් තීරණ ගැනීම සහ සමාලෝචන කමිටු තීරණ දැනුම් දීම අවසන් කිරීම |
| දෙසැම්බර් 07 ට පෙර | රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| 2027 ජනවාරි 01 දින | වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම |

7. **වාර්ෂික ස්ථානමාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.**

i. ස්ථාන මාරුවීම ඉල්ලීමේ දී හා අභියාචනා ඉදිරිපත් කිරීමේ දී සලකා බැලිය යුතු වන්නේ ඒ සඳහා සකස් කර ඉදිරිපත් කරනු ලැබූ ආදර්ශ අයදුම් පත් මඟින් කරනු ලබන ඉල්ලීම් පමණි.

ii. ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය.නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමට නිලධාරියා ක්‍රියාකළ යුතු වන්නේය.

iii. කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු භාර දෙනු ලබන අභියාචනය අදාළ සියළු ලිපි ගොනු, ලිපි ලේඛන හා වාර්ථා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් වග බලාගත යුතු වන්නේය.

iv. ඉහත වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත ස්ථානමාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

v. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපි ගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යවනු ලබන්නේය.



CamScanner

vi. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුවද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අවසන් තීරණය ලැබෙන තෙක් අදාළ ස්ථානමාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එස්. ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3. ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
[illegible]

එස්. ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්



CS CamScanner